ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරණ ලද ස්ථාවර නියෝග 119(4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 57

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ

| රා.ගි.කා.සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම් | කාරක සභාවේ නිර්දේශයන් /නියෝග | ගණන්දීමේ නිලධාරී විසින් ගත්ක්‍රියා මාර්ග | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|---|
| 2016 වර්ෂයට ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වෙන්කල රු.මිලියන 296 ක මුලු ප්‍රතිපාදන වලින් 30% ක පමණ ඉතිරියක් (රු.මිලියන 90) වාර්තා වී තිබීම. | වාර්ෂික ප්‍රතිපාදන නිසි කලට ලබාගැනීම සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සමග සාකච්ඡාකර සුදුසු ක්‍රම වේදයක් සකස් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ලෙස කාරක සභාව ප්‍රධාන ගනන්දීමේ නිළධාරීට දැන්වීය. | මෙ සම්බන්ධයෙන් විගණන කළමනාකරණ කමිටු වලදී සාකච්ඡා කරන ලදී. ඒ අනුව භාණ්ඩාගාරයේ කළමනාකරණවිගණන දෙපාර්තමේන්තුව විසින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් තොරතුරු ලබා ගැනීමෙන් පසු අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු දැනුවත් කර ඇත. ඊට අමතරව දිස්ත්‍රික් ලේකම් මාතලේ විසින්ද අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නිළධාරීන් දැනුවත් කර ඇත.( ඇමුණුම 01,02,03) | සියලුම ආයතන විධිමත්ව දැනුවත් කර ඇත. |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 6ක රු.2,501 663/=ක් වටිනා ව්‍යාපෘති 7ක පැවති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු නොකිරීම | විශේෂයෙන් ඇස්තමේන්තු ඉංග්‍රීසි භාෂාවෙන් පමනක් සකස් කිරීම නිසා නිළධාරීන්ට විවිධ ගැටලු වලට මුහුණ දීමට සිදුවන බැවින් සිංහල සහ දෙමළ භාෂාවලින් ඇමුණුමක් ලෙස ඇස්තමේන්තු සාරාංශය ඉදිරිපත් කිරීම කාලීන අවශ්‍යතාවයක් වී ඇතිබවයි . | මාතලේ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් වරුන් දැනුවත් කර ඇත.( ඇමුණුම 04) | දැනට ඒ අනුව කටයුතු සිදුවේ |
| 2002වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා කාලය තුල විල්ගමුව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ හෙට්ටිපොල නගරයේ පදිංචිකරුවන් සහ ව්‍යාපාරිකයන් 11 දෙනෙකුගෙන්අයවියයුතු රු.1503600/=ක බදු මුදල් මේදක්වා අයකරගැනීමට කටයුතු නොකිරීම. | මෙසම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත්කරන ලෙසට ප්‍ර.ග.නි.ට නියෝග කලේය. | 2017/09/19 දින අදාල සවිස්තරාත්මක වාර්තාව රාජ්‍ය ගිනුම් කාරක සභාව වෙත ඉදිරිපත් කරඇත. (ඇමුණුම 05) | හෙට්ටිපොල නගරයේ ගැටලුව විසදීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු සංකීර්ණයේදී ගරු ඉඩම් අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමා ප්‍රමුඛත්වයෙන් සාකච්ඡාවක් පවත්වන ලදී. එහි සාකච්ඡා වූ පරිදි අදාල මැනුම නැවත විවෘත කිරීම සඳහා තීරණය විය. ඒ අනුව නව මැනුම් විවෘත කිරීමෙන් පසු රජයේ ඉඩම් හා පෞද්ගලික ඉඩම් වෙන් කොට හදුනා ගැනීමෙන් අනතුරුව නැවත ඉඩම් කච්චේරියක් පවත්වා අවසානාත්මක තීරණ වලට එළඹීම සුදුසු බවට එහිදී තීරණය විය. එම විශේෂ සාකච්ඡාව අනුව |

| | | | |
|---|---|---|---|
| | | | මෙම ගැටලුවේ ඉදිරි පියවර ගැනීම සඳහා උපදෙස් ලබා ගැනීමට ඉඩම් කොමසාරිස් ජනරාල්ට හා සර්වේ ජනරාල්ටද පිටපත් සහිතව ඉඩම් අමාත්‍යාංශ ලේකම් වෙත යොමුකරණ ලද අංක 12/3/2/17/1-1v හා 2018.10.04 දිනැති ලිපිය අනුව සර්වේ ජනරාල් විසින් අංක SAG(F)/10035/E01-2018/17 හා 2018.10.22 දිනැති ලිපිය මගින් මාතලේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත අදාල මැනුම් ඉල්ලීම ලද පසු හැකි ඉක්මනින් මැනුම් විවෘත කිරීම සම්බන්ධ අවශ්‍ය කටයුතු සිදු කරණ ලෙස දන්නව ලදී.අංක 12/3/2/17/1-1v හා 2018.10.04 දිනැති ලිපිය මගින් හෙට්ටිපොල නගරයේ ඉඩම් ගැටලුව විසදීම සඳහා මායිම් නැවත විවෘත කිරීම සම්බන්ධ මැනුම් ඉල්ලීම මාතලේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙතයොමුකරණ ලදී. ඒ අනුව 2019.02.14 දින හෙට්ටිපොල නගරයට අදාල ඉඩම් ගැටලුව සම්බන්ධව උද්ගතව තිබූ රජය හිමිකම් කියන සහ රජය හිමිකම් නොකියන සීමාවට එනම් Ma/WLG/2013/256 හා2013.06.17 දිනැතිව මැනුම්පති විසින් සකස්කර තිබූ අනුරේඛණයේ මායිම් නැවත විවෘත කර අදාල පාර්ශවයන් සඳහා රජයේ මිනින්දෝරු මහතා විසින් අදාල ක්ෂේත්‍රයේ මායිම් පෙන්වාදීම සිදුකරණ ලදී.හෙට්ටිපොල වසමේ ග්‍රාම නිළධාරී ජනපද නිළධාරී හා හෙට්ටිපොල වෙළඳ සංගමයේ සාමාජිකයින් තිදෙනෙක් සඳහා අදාල මායිම් නිවුරදිව පෙන්වා දුන්බව මාතලේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවිසින් මා/මැ//WLG/2019/35 හා 2019.03.19 දිනැති ලිපිය මගින් දන්වා ඇත.මෙම ගැටලුවට අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම ඉඩම් කෙමසාරිස් ජනරාල්ගේ 4/10/22/ මාතලේ විවිධ/2014හා 2015.10.22 ලිපිය මගින් තාවකාලිකව |

| | | | |
|---|---|---|---|
| | | | අත්හිටවන ලෙස විල්ගමුව ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දී ඇති බැවින් එම තාවකාලික අත්හිටුවීම ඉවත් කර රජයේ ඉඩම් සීමාව තුල අනවසරයෙන් භුක්ති විදින ව්‍යාපාරිකයින් හා පදිංචි කරුවන් සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක2008/04 චක්‍රෙල්ඛය අනුව ඉඩම් කච්චේරියක් පවත්වා අනවසරකරුවන් සඳහා සුදුසුකම් අනුව බලපත්‍ර ලබා දීම සුදුසු බවට ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත 12/3/2/17/1-1v හා 2019.03.25 දිනැති ලිපිය මගින් විල්ගමුව ප්‍රාදේශීය ලේකම් විසින් යෝජනා කර ඇත. ( ඇමුණුම 06,07,08) |
| 2007, 2008 සහ 2009 වර්ෂවල ගම නැගුම ජාතික ව්‍යාපෘතිය යටතේ රු.1,177,331/=ක් වැයකර විල්ගමුව බත්ගම්පල ඉදිකරණ ලද සහල් සැකසුම් මධ්‍යස්ථානය සහ රු.330,000/=ක් වැයකර මිලදීගෙන තිබූ යන්ත්‍ර දෙකක් නිශ්කාර්යව පැවතීම. | නිළධාරීන්ගේ නොසැලකිල්ල හෝ වෙනත් පාර්ශවයක බලපෑම් මත මෙවැනි කටයුතු සිදුවිය හැකි බව අවධාරනය කළ කාරක සභාව ඒ පිළිබඳවසවිස්තර වාර්තාවක් ලබාදෙන ලෙසනියෝග කලේය. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් ගේ අංක HA/F/16/MTL.PAC/2017 දරණ2018.10.18 දිනැති ලිපිය අනුව මාතලේ දිස්ත්‍රික් ලේකම්ගේ අංක 1/2/13/1/5 දරණ 2018.11.05 දිනැති ලිපිය මගින් පරීක්ෂණ මණ්ඩලයක් පත් කරණ ලදී. | පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව දින කාර්යාලය වෙත භාරදී ඇතත් වගකිවයුතු අය නිශ්චිතවම සඳහන් කර නොතිබීම නිසා නැවත පරීක්ෂණයක් සිදු කරන ලෙස දැනුම් දී ඇත. එම වාර්තාව ලද පසු සුදුසු පරිදි කටයුතු කරමි. ( ඇමුණුම 09,10,11) |
| 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා පොදුතැන්පත් ගිණුමේ වර්ෂ 2ක ඉක්මවූ රු.20874677/=ක තැන්පතු රදවාගෙන තිබීම හා 2017.07.15 වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3ක වර්ෂ 2ට වැඩි රු.4,726,366/=ක තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු නොකිරීම. | ඉඩම් වන්දි ලබාදීම සඳහා තැන්පත් ගිනුමේ රදවාගත් ඉහත මුදලින් රු.686792/=ක් හැර ඉතිරි මුදල් දැනට නිරවුල් කර ඇති බවත් මුදල් රෙගුලාසි වලට අනුකූලව යවතින ශේෂයන්ද කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරණ බවත් ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. | ඉඩම් වන්දි හැර කල් ඉකුත්වී ඇති සියලුම පොදුතැන්පත් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර ඇත. | සෑම මසකම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් වාර්තාවක් ගෙන්වාගෙන මාසිකව අධීක්ෂණය කරනු ලැබේ.ඒ අනුව දැනට කල් ඉකුත් වූ ශේෂයන් කිසිවක් නොමැත. |
| 2014 දෙසැම්බර් 31 දිනට විෂයය අංක 25901දරණ රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පාර්ලිමේන්තුව විසින් පනවා ඇති අවම සීමාව රු.27000000/=ක් වුවත් තථ්‍ය ලැබීම් | මේ සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් සති 3ක් තුල කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව නියෝග කලේය. | 2017/09/19 දින අදාල සවිස්තරාත්මක වාර්තාව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කරඇත. (ඇමුණුම 05) | 2014.12.31 දිනැති සීමා සංශෝධන ඉල්ලුම්පත්‍රය සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ අයවැය දෙපාර්තමේන්තුවෙන් අනුමැතියක් නොලැබුනු බැවින් මේ සම්බන්ධයෙන් දුරකථනයෙන් කරන ලද විමසීමේදී 2014 වර්ෂයේ |

| | | | |
|---|---|---|---|
| රු.25,725,987/=ක් වීමෙන් රු.1,274,013/=කින් එම සීමාවට ලගා නොවීම. | | | අයදුම්පත්‍රයක් සම්බන්ධයෙන් මෙම වර්ෂයේ අනුමැතිය ලබාදිය නොහැකි බව ප්‍රකාශ කරන ලදී. (ඇමුණුම 12) |
| 2016 මුල්භාගයේ මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මිල නියම කිරීමේ කමිටුව මධ්‍යම පලාතේ අනෙකුත් දිස්ත්‍රික්ක වලට සාපේක්ෂව ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා අධි ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමෙන් රජයට මූල්‍යාමය පාඩුවක් සිදුකර තිබීම. | මේ පිළිඹදව අවධානය යොමුකල කාරක සභාව පළාත් සභාව අනුමත කරණ මිලගනන් අනුව ගෙවීම් සිදුකල යුතු බව අවධාරණය කලේය. | 2017 වර්ෂයේ මුල් භාගයේ අනුමත කරඇති මිල ගණන් භාවිතා නොකරන ලෙස දැනුවත් කර ඇත. (ඇමුණුම 13) | දැනට මිල ගණන් නියම කිරීමේදී ආසන්නම දිස්ත්‍රික්කයන් වන මහනුවර,නුවර එළිය හා මධ්‍යම පළාත් සභාවේ මිල ගණන්ද සැලකිල්ලට ගෙන මිල නියම කරනු ලැබේ. |
| ශක්‍යතා අධ්‍යනයකින් තොරව රු.6,265,078/=ක් වැය කර නාඋල හබරගහමඩ ඉදිකර ඇති අත්යන්ත්‍ර ජේෂකර්ම මධ්‍යස්ථානය 2017 ජූනි වන විටත් අරමුණු ගත කාර්ය වෙනුවෙන් යොදාගෙන නොතිබීම ගොඩනැගිල්ලේ බොහෝ ඉදිකිරීම් දුර්වලතා පැවතීම, මහණ මැෂින් 23ක් කතුරු 11ක් කමිස රෙදි යාර 240ක් ඇතුලු අනෙකුත් උපාංග වර්ෂ 2 කාලයක් නිෂ්කාර්යව පැවතීම. | යටවත්ත සහ නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල අත්යන්ත්‍ර පුහුනු මධ්‍යස්ථාන පවත්වා ගෙන යාමේ අපේක්ෂාවෙන් මහන මැෂින් සහ අනෙකුත් උපාංග මිලදී ගෙන තිබුනත් අරමුණු ඉටු නොවීම නිසා අදාල ගොඩනැගිල්ල ජාතික තරුණසේවා සභාවේ පුහුණු මධ්‍යස්ථානයක් සඳහා භාරදී ඇති බව ප්‍ර.ග.නි./ග.නිග පැවසීය. | 2017 වර්ෂයේදී මෙම ගොඩනැගිල්ල ජාතික තරුණසේවා සභාව වෙත පවරා දී ඇත. | ජාතික තරුණසේවා සභාව විසින් කරාතේ, භාෂා පුහුණු ආදී පාඨමාලාවන් පවත්වාගෙන යන අතර මෙම ගොඩනැගිල්ල සඳහා විදුලිය හා ජලය නොමැතිකම නිසා දැනට ගොඩනැගිල්ල විදුලි රැහැන් ඇදීම සිදුකර ,යූත් විත් ටැලන්ට් වැඩසටහන යටතේ ලක්ෂ 3ක ප්‍රතිපාදන ලබාගෙන විදුලිය හා ජලය ලබාගැනීම සඳහා ඇස්තමේන්තු ලබාදෙන ලෙස අදාල ආයතන වෙත දැනුම්දී ඇත. (ඇමුණුම 14,15 ) |
| 2014 වර්ෂයට ඇස්තමේන්තුගත පිරිවැය රු.62232742/=ක් වූ ව්‍යාපෘති 09ක ඉදිකිරීම් අඩක් නිමකර ඒ සඳහා රු.17183008/=ක් වැයකර තිබුණද විවිධ හේතුන් මත එම ව්‍යාපෘති අතහැර දමා තිබීම. | බොහෝ දිස්ත්‍රික්කවලඅතහැර දැමූ ව්‍යාපෘති දක්නට ලැබීම බරපතල ගැටලුවක් බව අවධාරණය කළ කාරක සභාව සියලු දිස්ත්‍රික්කවල පවතින එවැනි ව්‍යාපෘති පිළිඹදව අධ්‍යනයක් සිදුකර කාරකසභාවට වාර්තාවක් ලබාදෙන ලෙස විගණකාධිපතිවරයාට නියෝග කලේය. | (1)මාතලේ හන්දියේ සිට පත්කොල ගොල්ල පාර(රු.2000000.00) ලබාදී ඇති අත්තිකාරම් මුදල රු.392000.00ආපසු පියවා ගැනීමට කටයුතු කර ඇත. | වර්තමානය වන විට අදාළ මාර්ගය ප්‍රාදේශීය සභාව මඟින් පුළුල් කර කැටගල් අතුරා මනාව සකස් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | | (11) තිත්තවැල්ගොල්ල සායන/කායවර්ධනමධ්‍යස්ථානය (රු.1000000.00)<br><br>ඉඩම පවරා ගැනීම පිණිස හා ගෙවීම් කටයුතු සඳහා නිර්දේශය ලබා ගැනීමට කමිටුවක් පත්කර ඇත.<br>කමිටු සාමාජිකයින්<br>1. මාතලේ දිස්ත්‍රික් ඉංජිනේරු<br>2. දඹුල්ල මහ නගරසභා නාගරික ඉංජිනේරු<br>3. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිළධාරී. | නගරාධිපතිතුමාගේ 2019.03.11 දිනැති ලිපිය අනුව නිර්දේශ ලබා ගැනීමට පත් කළ කමිටුව අදාල කාර්යය පරික්ෂා කර බලා ගිවිසුම් ප්‍රකාරව කරන ලද වැඩ සඳහා තක්සේරු කරන ලද මුදලක් නිර්දේශ කර ඇති අතර අතිරේක වැඩ සඳහා ද නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර ඉදිරි කාලයේ දී ගෙවීම් කටයතු සිදු කරන බවට දන්වා ඇත. |
| | | (111) බණ්ඩාරපොල මහා විද්‍යාලයේ පාසැල් ගොඩනැගිල්ල (8250000.00)<br><br>2018/03/19 දින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කරන ලදී.ඒ අනුව අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලෙස ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශයවෙත දැනුම් දී ඇත. | 'ළඟම පාසැල හොඳම පාසැල' වැඩසටහන යටතේ A ව්‍යාපෘතියට මෙම ව්‍යාපෘතිය ඇතුලත් කර ඇති අතර ඒ අනුව මෙම කර්මාන්තයේ ඉදිරි වැඩ සඳහා ඇස්තමේන්තු සකස් කර ටෙන්ඩර් කැඳවීම සඳහා 2019/01/08වන දින පුවත්පත් දැන්වීමක් පල කිරීම පිණිස කටයුතු කර ඇතිබව මධ්‍යම පළාත් ඉංජිනේරුසේවා දෙපාර්තමේන්තුව මගින් දැනුම්දී ඇත.(ඇමුණුම16,17,18 ) |
| | | (1V) සැලගම ක්‍රීඩා පිටිය සංවර්ධනය (490870.00)<br><br>ක්‍රීඩා පිටිය ක්‍රීඩාකටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කර ඇත | සම්පූර්ණ වියදම දරා ඇත්තේ ක්‍රීඩා පිටිය සංවර්ධනය සඳහා පමණි. බැම්ම ඉදි කිරීම සඳහා කිසිදු වියදමක් දරා නැත.බැම්ම ඉදිකර නොතිබීම ක්‍රීඩා පිටිය භාවිතා කිරීම සඳහා බාධාවක් නොමැති අතර ඒ අනුව දැනට ක්‍රීඩා පිටිය ක්‍රීඩා සඳහා යොදාගනු ලබයි. |
| | | (V) දලුවෙල සේවා මධ්‍යස්ථානය ඉදි කිරීම (රු.261274.00)<br><br>සේවා මධ්‍යස්ථානය සම්පූර්ණයෙන්ම ඉදිකිරීම් අවසන් කර ඇත. | සේවා මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ග්‍රාම නිළධාරී කාර්යාලය ඇතුළු කාර්යාල කටයුතු පවත්වාගෙන යයි. |
| | | (V1) උඩගම ජල යෝජනා ක්‍රමය (1000000.00)<br><br>අවසන් කර ඇත. | මෙම ව්‍යාපෘතිය යටතේ මහජනතාව වෙත ජලය ලබාදෙන අතර ප්‍රයෝජනයට ගනී. |
| | | (V11) මකුලේමඩ මානික්කාවත්ත | මාර්ගය සාදා අවසන් කර ඇති |

| | | | |
|---|---|---|---|
| | | මාර්ගය සංවර්ධනය කිරීම(රු.784000.00)<br><br>මාර්ගය සාදා අවසන් කර ඇත. | බැවින් මහජනතාව ප්‍රයෝජනයට ගනී. |
| | | (V111) ගලඋඩ හේන හා බ්‍රැන්ඩිගල ප්‍රදේශය සංචාරක කළාපයක් ලෙස සංවර්ධනය කිරීම(රු.5000000.00) | උද්භිත උද්‍යාන දෙපාර්තමේන්තුව මගින් 2012 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය සහිතව මෙම ව්‍යාපෘතියට ඇස්තමේන්තු සඳහා ප්‍රතිපාදන නිදහස් කලද ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීය. |
| | | (1X) ටී.බී. තෙන්නකෝන් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම-දඹුල්ල(43446598.00)<br><br>**දීර්ඝ කාලීන බදු පදනමට ලබාදුන් ඉඩමක මෙම සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සම්බන්ධව පැවති මතභේදකාරී තත්වය හේතුවෙන් 2016 වර්ෂයේ මෙහි ඉදිකිරීම් සිදු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් 2017.07.14 දින නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් විමසා ලිපියක් යොමුකර ඇත.** | **2017.10.04 දින නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලද පිළිතුරු ලිපිය අනුව ඉදිරි අයවැය මගින් අදාළ ප්‍රතිපාදන වෙන්කර ගැනීම සුදුසු බව දන්වා ඇත. මේ සම්බන්ධයෙන් ඉදිරි උපදෙස් ලබා ගැනීම පිණිස ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත 2018.01.18 දිනැති අංක DS/5/5/T.B.T./01 ලිපියෙන් දන්වා ඇත.** (ඇමුණුම19 ) |

දිස්ත්‍රික් ලේකම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

මාතලේ

එස්.එම්.ජී.කේ. පෙරේරා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
මාතලේ.

ප්‍රධාන ගණකාධිකාරී

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

මාතලේ

එස්.කේ. තිලකරත්න
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මාතලේ.

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

එච්.ටී. කමල් පත්මසිරි
ලේකම්
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත්
සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

එච්.ටී. කමල් පත්මසිරි
ලේකම්
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශ හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලෙස දැනටමත් මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර ඒ සඳහා දිස්ත්‍රික් ලේකම් විසින් අදාළ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම තුළින් පෙන්වා දෙන ලද අඩුපාඩු මගහරවාගනිමින් 2019 හා 2020 වර්ෂය තුළදී එහි සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ලඟා කරවීමට අපේක්ෂා කරමි.

වජිර අබේවර්ධන (පා.ම.)
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

වජිර අබේවර්ධන
අමාත්‍යතුමා
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

178

# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
# முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
# DEPARTMENT OF MANAGEMENT AUDIT

මහලේකම් කාර්යාලය, කොළඹ 01 | செயலகம், கொழும்பு 01 | The Secretariat, Colombo 01

මගේ අංකය / எனது இல / My No: DMA/AMC/2017/5-187
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2018.03.26

ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

**<u>අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා දෙන ප්‍රාග්ධන ප්‍රතිපාදන</u>**

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත වාර්ෂිකව ලබා දෙන ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාද වී ලබාදීම සම්බන්ධව දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී නිරතුරුවම සාකච්ඡාවට භාජනය වන ප්‍රධාන කරුණකි.

02. මෙම ප්‍රතිපාදන බොහෝ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් වර්ෂය අවසාන කාලයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා දෙන බැවින් ප්‍රාග්ධන ව්‍යාපෘතීන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල කාර්යසාධනය නියමිත පරිදි පෙන්වීමට නොහැකි වීමත්, එය විගණන විමසුම් වලට හේතු වී ඇති බවත් 2018.03.06 වන දින පැවති මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 4 වන කාර්තුවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී මෙන්ම අනෙකුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී ද විටින් විට සාකච්ඡා වන අතර, වසරේ මුල්කාර්තුව තුළ අදාල ප්‍රාග්ධන ප්‍රතිපාදන ලබාදීම සඳහා භාණ්ඩාගාරය මැදිහත්වීමක් විය යුතු බවට ද සාකච්ඡා වී ඇත.

03.එබැවින් මෙම ප්‍රතිපාදන වසරේ ජූනි 30 දින වන විටවිත් අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට ලබා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස එම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලිඛිතව දැනුම් දීමට අවශ්‍ය කටයුතු කරන්නේ නම් ඉතාමත් අගය කොට සලකමි.

එස්. ඒ. චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත: ප්‍රධාන අභ්‍යන්තර විගණක, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - අවශ්‍ය කටයුතු සඳහා

කාර්යාලය / அலுவலகம் / Office: 2484816, 2484500, 2484600
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: +4111 2484543
ෆැක්ස් / தொலைநகல் / Fax: [illegible]
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
**DEPARTMENT OF MANAGEMENT AUDIT**

මහලේකම් කාර්යාලය, කොළඹ 01 | செயலகம், கொழும்பு 01 | The Secretariat, Colombo 01

මගේ අංකය / எனது இல / My No: DMA/AMC/2017/5-187
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2018.03.26

ප්‍රධාන අභ්‍යන්තර විගණක,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

**අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා දෙන ප්‍රාග්ධන ප්‍රතිපාදන**

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත වාර්ෂිකව ලබා දෙන ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාද වී ලබාදීම සම්බන්ධව දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී නිරතුරුවම සාකච්ඡාවට භාජනය වන ප්‍රධාන කරුණකි.

02. මෙම ප්‍රතිපාදන බොහෝ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් වර්ෂය අවසාන කාලයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා දෙන බැවින් ප්‍රාග්ධන ව්‍යාපෘතීන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල කාර්යසාධනය නියමිත පරිදි පෙන්වීමට නොහැකි වීමත්, එය විගණන විමසුම් වලට හේතු වී ඇති බවත් 2018.03.06 වන දින පැවති මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 4 වන කාර්තුවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී මෙන්ම අනෙකුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී ද විටින් විට සාකච්ඡා වන අතර, වසරේ මුල්කාර්තුව තුළ අදාල ප්‍රාග්ධන ප්‍රතිපාදන ලබාදීම සඳහා භාණ්ඩාගාරය මැදිහත්වීමක් විය යුතු බවට ද සාකච්ඡා වී ඇත.

03.එබැවින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත වාර්ෂිකව ප්‍රාග්ධන ප්‍රතිපාදන ලබා දෙන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු පිළිබඳව හඳුනාගෙන මෙම ගැටලුව පිළිබඳ අදාළ ආයතන දැනුවත් කිරීම සඳහා එම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මොනවාද යන්න පිළිබඳ අප වෙත දන්වා එවන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

මේ සම්බන්ධව ඔබගෙන් ලැබෙන සහයෝගය අගය කොට සලකමි.

o/c

එස්. ඒ. චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්


කාර්යාලය / அலுவலகம் / Office: 2484816, 2484500, 2484600
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: (9411) 2484543
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2449496
වෙබ් අඩවිය / வெப் சைட் / website: www.treasury.gov.lk

ඇමුණුම (03)

කාර්යාලය/அலுவலகம்/Office - 066 2222[illegible]

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ
## மாவட்ட செயலகம் - மாத்தளை
## DISTRICT SECRETARIAT – MATALE

දිසාපති/දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர் / GA/District Secretary } 066 2222[illegible] 066 2222[illegible]

නිල නිවස / விடுதி / Residency } 066 2222[illegible]

වෙබ් අඩවිය / இணைய தளம் / Web Site } WWW.matale.dist.gov.lk

විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail } moha.dist.matale@gmail.com

ෆැක්ස් / பெக்ஸ் / Fax } 066 2228[illegible]

මගේ අංකය / எனது இல. / My No } 1/2/14

ඔබේ අංකය / உமது இல. / Your No }

දිනය / திகதி / Date } 2018.08. 11

201, 101, 104, 106, 118, 136, 140, 122, 154, 159, 166, 201, 163, 147, 196, 151, 162, 165, 202,

.................................

බොහෝ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් පසුගිය වසර කිහිපය තුලදී වසර අවසන් මාස කිහිපය තුල විවිධ කාර්යයන් සදහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ප්‍රතිපාදන වෙන්කර ඇත. එම ප්‍රතිපාදන අනුව වර්ෂය අවසානයේ මිලදී ගැනීම්,ඉදිකිරීම් වැනි කාර්යයන් නියමිත පරිදි ඉටුකරීමට නොහැකි වීම නිසා පහත සදහන් පරිදි විවිධ ගැටළු වලට මුහුණ දීමට සිදුවී ඇත.

1. ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව අනුගමනය කරමින් කටයුතු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වීම.
2. හදිසි ඇණවුම් ලබා දීමේ දී සැපයුම් කරුවන් වෙත තොග නොමැති වීම නිසා දෙසැම්බර් 31 දිනට පෙර භාණ්ඩ ලබා ගැනීමේ ගැටළුව.
3. ඒ අනුව තොග පොත් ඉන්වෙන්ට්‍රි යාවත්කාලීනව පවත්වා ගෙන යාමේ ගැටළු සහගත තත්වයක් ඇති වීම හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලදී ගැටළු වලට මුහුණ දීමට සිදුවීම.
4. ප්‍රතිපාදන ඉතිරිවීම නිසා අදාල සේවාවන් සිදුනොවීම මත විගණන විමසුම් වලට ලක්වීමට සිදුවීම.
5. කෙටි කාලයක් තුල විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් ලැබීම මත භාණ්ඩාගාරය වෙතින් අග්‍රිම ලබා ගැනීමේ අපහසු තාවය හා දෙසැම්බර් 31 දිනට ගිණුම් පියවීම කටයුතු නිසි පරිදි සිදු කිරීමේදී ගැටළු සහගත තත්වයන් ඇති වීම.
6. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත සීමිත කාර්ය මණ්ඩලයක් තුළින් එම සියළු කටයුතු එකවර සිදුකිරීමට සිදුවීම තුළින් නිලධාරීන් දැඩි අපහසුතාවයට ලක්වීම.

ඉහත සදහන් ගැටළුකාරී තත්වය මත පසුගිය වසර කීපය තුල වෙනත් දෙපාර්තුමේන්තු ප්‍රතිපාදන සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීමවිගණන විමසුම් යොමු වීම හා ඒවාට පිළිතුරු දීම සිදුවී ඇත.

එම නිසා 2018 වර්ෂය සදහා ඔබ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු යටතේ මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරන්නේ නම් 2018.09.30 දිනට පෙර ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටින අතර ඊට පසු ප්‍රතිපාදන ලබා දෙන්නේ නම් ඒ පිළිබද සලකා බලා අදාල සේවාව ඉටු කිරීමට නොහැකි වේ යැයි අපේක්ෂා කරනු ලබන ප්‍රතිපාදන සියල්ල ඔබ වෙත ආපසු පවරා දීමට සිදුවන බව තවදුරටත් කාරුණිකව දැනුම් දෙමි.

,ට/ට

එස්.එම්.පී.කේ.පෙරේරා
දිසාපති/දිස්ත්‍රික් ලේකම්,
මාතලේ.

| අතිරේක දිස්ත්‍රික් ලේකම් | සහකාර දිස්ත්‍රික් ලේකම් | ප්‍රධාන ගණකාධිකාරී | පරිපාලන නිලධාරී | අධ්‍යක්ෂ (සැලසුම්) | ස.කොමසාරිස් -සමෘද්ධි |
|---|---|---|---|---|---|
| மேலதிக மா.செயலாளர் | உதவி மா.செயலாளர் | பிரதான கணக்காளர் | நிருவாக அலுவலர் | பணிப்பாளர் திட்டமிடல் | உதவி ஆணையாளர் சமுர்த்தி |
| Add.Dis.Secretary | Asst. Dis.Secretary | Chief Accountant | Admin. Officer | Director (Planning) | Asst.Com.-Samurdhi |
| 066 2222413 | 066 2222215 | 066 2222785 | 066 2222700 | 066 2222143 | 066 2222051 |

ඇමුණුම (04)

(163)

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ
மாவட்ட செயலகம் - மாத்தளை
DISTRICT SECRETARIAT – MATALE


කාර්යාලය / அலுவலகம் / Office - 066 2222233
දිසාපති/දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர் / GA/District Secretary - 066 2222235, 066 2222236
නිල නිවස / வீடு / Residency - 066 2222205
වෙබ් අඩවිය / இணையத் தளம் / Web Site - WWW.matale.dist.gov.lk
විද්‍යුත් තැපෑල / ஈ-மெயில் / e-mail - moha.dist.matale@gmail.com
ෆැක්ස් / பெக்ஸ் / Fax - 066 2226542


මගේ අංකය / எனது / My No: 1/11/1/1
ඔබේ අංකය / உமது இல. / Your No:
දිනය / திகதி / Date: 2018.03.06

දිස්ත්‍රික් ලේ... 09 MAR 2018 අභ්‍යන්තර විගණන අංශය

මාතලේ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**ගිණුම් කාරක සභා තීරණ දැනුම් දීම.**

2017 වර්ෂයේ මැද පවත්වනු ලැබූ ගිණුම් කාරක සභාවේදී ඇස්තමේන්තු ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කිරීම හේතුවෙන් මහජනතාවට තේරුම් ගැනීමේ අපහසුතා පවතින බව කමිටු සාමාජිකවරුන් විසින් සඳහන් කරන ලදී.

02. මෙහිදී විශේෂයෙන් අවධානය යොමු වූයේ ගොඩනැගිලි සම්මත මිල ගණන් හි (BSR) වැඩ විෂයන් සම්බන්ධ විස්තර ඉංග්‍රීසි භාෂාවෙන් පැවතීම හා එය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමේ දී අදාල තාක්ෂණ යෙදුම් සමග නියමිත අදහස ගම්‍ය වන පරිදි නිවැරදිව ඉටු කිරීමේ ප්‍රායෝගික අපහසුව පිළිබඳවයි.

03. එබැවින් මහජන නියෝජිතයන්ගේ මැදිහත් වීමෙන් ක්‍රියාත්මක වන විමධ්‍යගත අයවැය වැඩසටහන, ග්‍රාමීය සංවර්ධන වැඩසටහන වැනි ව්‍යාපෘති වලට අදාලව ඇස්තමේන්තු කිරීමේදී, ඇස්තමේන්තුව නියමිත පරිදි පිරිවිතරයන්ට අනුව සකස් කර ඊට වැඩිමනත් වශයෙන් පහලින් සිංහල භාෂාවෙන් ව්‍යාපෘතිය පිළිබඳව කෙටි හැඳින්වීමක් කිරීම සුදුසු බව යෝජනා විය. මේ අනුව කොන්ක්‍රීට් මාර්ගයක් වැනි ඉදිකිරීමකදී, මාර්ගයේ දිග පළල, ඝනකම හා කොන්ක්‍රීට් මිශ්‍රණය පිළිබඳ තොරතුරු ගොඩනැගිලි ඉදිකිරීමකදී එහි දිග පළල, ඉදිකිරීමට යෝජිත මට්ටම ( උදා :- අත්තිවාරම, පලමු මහල......වැනි) තොරතුරු ඇස්තමේන්තුව සමග ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි.

ඩී.පී.ජී.කුමාරසිරි,
දිස්ත්‍රික් ලේකම් / දිසාපති,
මාතලේ.

පිටපත :-
01. විගණන අධිකාරී - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ. - කාරුණික දැනගැනීම පිණිස.
02. ප්‍රධාන ගණකාධිකාරී - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ. - එම -
03. අභ්‍යන්තර විගණක - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,මාතලේ. - එම -


අතිරේක දිස්ත්‍රික් ලේකම් / மேலதிக மா.செயலாளர் / Add.Dis.Secretary / 066 2222413
සහකාර දිස්ත්‍රික් ලේකම් / உதவி மா.செயலாளர் / Asst. Dis.Secretary / 066 2222215
ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant / 066 2222785
පරිපාලන නිලධාරී / நிருவாக அலுவலர் / Admin. Officer / 066 2222700
අධ්‍යක්ෂ (සැලසුම්) / பணிப்பாளர் திட்டமிடல் / Director (Planning) / 066 2222143
ස.කොමසාරිස් සමෘද්ධි / உ.ஆணையாளர்-சமுர்த்தி / Asst.Com.-Samurdhi / 066 2222051

ඇමුණුම (05) 143 51 5-I


# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ
# மாவட்ட செயலகம் - மாத்தளை
# DISTRICT SECRETARIAT – MATALE

දුරකථන/தொலைபேசி/Telephone

දිසාපති/දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர் / GA/District Secretary – 066 2222235, 066 2222236

නිල නිවස / வீடு / Residency – 066 2222205

වෙබ් අඩවිය / இணைய தளம் / Web Site – www.matale.dist.gov.lk

විද්‍යුත් තැපෑල / ஈ-மெயில் / e-mail – gamatale@sltnet.lk

ෆැක්ස් / பெக்ஸ் / Fax – 066 2222235


මගේ අංකය / எனது இ / My no – 1/9/1/2017

ඔබේ අංකය / உமது இல. / Your No –

දිනය / திகதி / Date – 2017.09.19

ලේකම්,

රාජ්‍ය ගිණුම් කාරක සභාව.

**<u>විගණන ඡේද පරීක්ෂාව හා වත්මන් කාර්යය සාධනය පිළිබඳ රාජ්‍ය ගිණුම් කාරක සභා පරීක්ෂණය</u>**

**<u>2010,2011.2012 හා 2013 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබටද පිටපතක් සහිතව මා ඇමතූ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක HA/F/16/MTL.PAC/2017 හා 2017.08.21 දිනැති ලිපිය හා බැදේ.

02. ඒ අනුව 2017.07.28 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාවේදි සාකච්ඡා කල කරුණු සම්බන්ධ වර්තමාන තත්වය පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් මේ සමඟ ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි.

ඩී.පී.ජී.කුමාරසිරි,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
මාතලේ.

පිටපත- 01. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
02. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
03. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
04. ප්‍රධාන අභ්‍යන්තර විගණක, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස

o/c
2017.09.29


අතිරේක දිස්ත්‍රික් ලේකම් / மேலதிக மா.செயலாளர் / Add.Dis.Secretary / 066 2222413
සහකාර දිස්ත්‍රික් ලේකම් / உதவி மா.செயலாளர் / Asst..Dis.Secretary / 066 2222215
ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant / 066 2222785
පරිපාලන නිලධාරී / நிருவாக அலுவலர் / Admin. Officer / 066 2222700
අධ්‍යක්ෂ(සැලසුම්) / பணிப்பாளர் திட்டமிடல் / Director (Planning) / 066 2222143
ස.කොමසාරිස් -සමෘද්ධි / உதவி ஆணையாளர்-சமுர்த்தி / Asst.Com.-Samurdhi / 066 2222051

| පැහැදිලි කල යුතු කරුණු | වටිනාකම (රු.) | කරුණුවලට අදාළ වර්තමාන තත්වය (ගෙන ඇති පියවර) | වගකිව යුතු නිලධාරින් |
|---|---|---|---|
| විල්ගමුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ හෙට්ටිපොල නගරයේ පදිංචිකරුවන් හා ව්‍යාපාරිකයන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,503,600ක් වූ දීර්ඝකාලින බදු මුදල් අයකර ගැනිමට කටයුතු නොකිරිම. | 1,503,600 | • හෙට්ටිපොල නගරයේ අනවසර පදිංචිකරුවන් වෙත එම ඉඩම් සඳහා බදු මුදල් හා දඩ මුදල් ඇතුළුව විශාල මුදලක් ගෙවිමට ඇති බැවින් ඒ සඳහා විරෝධය ප්‍රකාශ කර ඇත. මාතලේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි මඟින් රජයේ ඉඩම් හඳුනා ගෙන ඇති අතර එහිදි පදිංචිකරුවන් 17දෙනෙකුගෙන් හත්දෙනෙකු පෞද්ගලික ඉඩම්වල රැදී සිටින අතර තිදෙනෙකු සින්නක්කර ඉඩම් මායිමෙ පදිංචිව ඇති අතර ඉන් හත්දෙනෙකු දීර්ඝ කාලින බදු වලට අයත්වේ.<br>• විල්ගමුව ප්‍රාදේශීය ලේකම්ගේ අංක 12/3/2/17 හා 2008.12.20 දිනැති ඉඩම් කොමසාරිස් වෙත යොමු කරන ලද ලිපිය මඟින් බදු මුදල් නොගෙවීම නිසා නීතිමය ක්‍රියා මාර්ග ගැනිම' සඳහා දීර්ඝකාලීන බදු අනුමත කිරිම අවලංගු කිරිමට නිර්දේශ කර ඇත.<br>• 2013.12.21 දින හෙට්ටිපොල නගර සීමාවේ මායිම් පැහැදිලිව හඳුනාගෙන ඇති බැවින් හා ඉඩම් කොමසාරිස්ගේ හා පළාත් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය මත සන්තකය ආපසු පවරා ගැනිමේ පනත යටතේ 2015.07.30 දින දැන්විම යොමු කර ඇත.<br>• ඒ අනුව ග්‍රාම නිලධාරි විසින් සන්තකය භාර නොදුන් බවට වූ වාර්තා 2015.07.05 දින දැනුම් දීමෙන් අනතුරුව උසාවිගත කිරිමට කටයුතු කරමින් පැවති අතරතුර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට 2015.03.24 දින කරන ලද පැමිණිල්ලකට අනුව සැප්තැම්බර් 15 දින දක්වා මෙය සමථයකට පත් කර ගැනිමට අපේක්ෂා කරන බැවින් සැප්තැම්බර් මස 15 දින දක්වා උසාවිගත කිරිමෙන් වලකින ලෙස දැනුම් දී ඇත.<br>• ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 4/10/මාතලේ/විවිධ/2014 හා 2015/09/30 දිනැති ලිපියෙන් කරන ලද දැනුම් දිම අනුව හෙට්ටිපොල නගරයේ රජයේ ඉඩම් කොටස් සඳහා සුදුසුකම් පරික්ෂා කර දිර්ඝ කාලින බදු බලපත්‍ර ලබා දිමටත් ඒ සඳහා එකඟ නොවන අයට සන්තකය ආපසු ගැනිමේ පනත යටතේ ඉදිරි කටයුතු කිරිමට ආරම්භ කරන ලදි.<br>• ගරු ඉඩම් අමාත්‍යතුමාගේ නියමය පරිදි ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 4/10/මාතලේ/විවිධ/2014 හා 2015/10/22 දිනැති ලිපිය මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි මෙම ගැටළුව නිම වන තුරු රජයේ ඉඩම්වලින් නෙරපා හැරීම තාවකාලිකව නවතා ඇති අතර දීර්ඝකාලින බදුකර ලබා දීමද තාවකාලිකව නතර කිරිමට සිදු විය.<br>• ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක 4-2/3/5/11 හා 2017.07.24 දිනැති ලිපිය අනුව ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් පරිදි 2008/04 චක්‍රලේඛය අනුව ක්‍රියා කිරීමට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව ඉඩම් කච්චේරියක් පවත්වා නියමානුකූල කිරීමට කටයුතු කරමින් පවතී. (ඇමුණුම 01) | විල්ගමුව ප්‍රාදේශීය ලේකම් |
| 2007,2008 හා 2009 වර්ෂවල ගමනැගුම ජාතික ව්‍යාපෘතිය යටතේ ලද ප්‍රතිපාදන රු.1,177,331ක් වැය කර විල්ගමුව | 1,177,331 | • මෙම ස්ථානයේ ඉදි කර තිබූ ගොඩනැගිල්ල සේවා පියසක් සඳහා 2013.06.03 දින විවෘත කර ආරම්භ කරන ලදි. සේවා පියසට යොදා ගෙන ඇති කොටස හැර වී වේලන මිදුල හා ගොඩනැගිල්ල, විල්ගමුව ස්වශක්ති ආබාධිත සංගමය හා විල්ගමුව වැඩිහිටි බල මණ්ඩලයේ සාමාජිකයින්ගේ අත්කම් හා ස්වයං රැකියා නිෂ්පාදන කටයුතු සිදු කරන මධ්‍යස්ථානයක් ලෙස | විල්ගමුව ප්‍රාදේශීය ලේකම් |

| | | | |
|---|---|---|---|
| බත්ගම්පල සහල් සැකසුම් මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණද එය සුදුසු ආයතනයකට ලබා දී ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකිරීම | | 2016.07.05 දින සාමාජිකයින් 75දෙනෙකුගේ සහභාගීත්වයෙන් ආරම්භ කර ඇත.<br>• විල්ගමුව කොට්ඨාශයේ ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩලයේ සාමාජික වැඩිහිටියන්ගේ ස්වයං රැකියා කටයුතුද වැඩි දියුණු කර සාමූහික කණ්ඩායම් ව්‍යාපාරයක් ලෙස පවත්වා ගෙන යාමට, පහන් තිර නිෂ්පාදන, ඇඳුම්/පාපිසි මැසීමේ කර්මාන්තය, ධාන්‍ය පිටි නිෂ්පාදන කටයුතු, කොසු ඉදල් නිෂ්පාදන යන නිෂ්පාදන කටයුතු වැඩිහිටි සංගමයෙන් 25දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2016.08.19 දින ආරම්භ කර ඇත.<br>• එම ස්ථානය අයත් භූමි ප්‍රදේශයේ වකුගඩු රෝගින්ට පිරිසිදු පානීය ජලය සැපයීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ජාතික ජල සම්පාදන මණ්ඩලයේ නිල නිවාස ඉදිකිරීම සඳහා දීර්ඝ කාලීන බදු ලෙස ලබා දීමට ක්‍රියා කරමින් පවතී. | |
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සැසඳුම් ප්‍රකාශය හා සම්බන්ධව 2014 දෙසැම්බර් 31දිනට විෂය අංක 25901 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතුවල පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ ලැබීම්වල අවම සීමාව රු.27,000,000ක් වුවද තථ්‍ය ලැබීම රු.25,725,987ක් වීමෙන් රු.1,274,013කින් එම සීමාවට ළඟා වී නොතිබීම | | • රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ 2014.12.31 දිනට සැසඳුම් ප්‍රකාශය අනුව අවම ලැබීම් සීමාව රු.27,000,000.00ක් වන අතර සත්‍ය වශයෙන්ම ලැබී ඇති මුදල රු.25,725,987.00ක් වේ. ඒ අනුව අවම බැර සීමාවෙහි වෙනස රු.1,274,013.00කි.<br>• 2014.12.31 දිනට රජයට අයවිය යුතු පහත සඳහන් ණය ශේෂයන් අයකර ගැනිමට කටයුතු කර තිබූ අතර ඒ අනුව අත්තිකාරම් බී ගිණුමෙහි අවම බැර සීමාව සංශෝධනය කිරීම සඳහා සීමා සංශෝධන අයදුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා නොකරන ලදි.<br>• 2014.12.31 දිනට අයකර ගැනිමට අපේක්ෂිතව තිබූ ණය ශේෂයන්<br>I. විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ — රු.841,342.00<br>II. මධ්‍යම පළාත් සභාවට ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂ — රු.1,250.00<br>III. අඹන්ගඟ ප්‍රාදේශීය සභාවට ස්ථාන මාරුවී නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂ — රු.116,117.00<br>IV දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් අය විය යුතු ණය ශේෂ — රු.195,000.00<br>රු.1,153,709.00<br>• නමුත් 2014 දෙසැම්බර් මස අවසාන වන විටත් මෙම ණය ශේෂයන් නිරවුල් නොවීම හේතුවෙන් අවම ලැබීම් සීමාවට ළඟාවීමට නොහැකි විය. එම නිසා 2014.12.31 දින සීමා සංශෝධනයක් ඉදිරිපත් කල අතර එය ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් නිර්දේශ කර අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ද ඉදිරිපත් කර ඇත. (ඇමුණුම 02 I හා II) | දිස්ත්‍රික් ලේකම් |

FAX NO. : 14 Apr. 2041 10:32AM P2

# ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
# காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சு
# Ministry of Lands & Parliamentary Reforms

"මිහිකත මැදුර", ඉඩම් ලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத மெதுர", காணிச் செயலகம், 1200/6, ராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatte Avenue, Battaramulla.

මගේ අංකය / எனது இல. / My No. 4-2/3/5/11
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2017.07.24

14 SEP 2017

ප්‍රාදේශීය ලේකම්
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
[illegible]

**විල්ගමුව හෙට්ටිපොල ගමරාළේ ඉඩම් ගැටළුව**

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත යොමු කරන ලද මගේ අංක 12/3/2/17/1-11 හා 2017.04.18 දිනැති ලිපිය හා [illegible]

[illegible] අනුව උක්ත ඉඩම් ගැටළුව සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රෝහිණී විජේරත්න මැතිනියට සහ අදාළ පාර්ශවයන් ආයතන හා පුද්ගලයන් වෙත දැනුම් දී ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් අනුව [illegible] කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

i) ඉ.ගු.පි. 10 පිඹුරේ කැබලි අංක 37,38,40,41,42,43,44, හා 02 යන ඉඩම් කොටස් රජය අයිතිවාසිකම් නොකියන හා පෞද්ගලික ඉඩම් වශයෙන් නිරවුල් කර ඇත. එබැවින් එම ඉඩම් සම්බන්ධයෙන් රජයට මැදිහත් විය නොහැක.

ii) කැබලි අංක 39 රජය සතු ඉඩම් කොටස් වශයෙන් නිරවුල් කර ඇති අතර එම ඉඩම් කොටසෙහි ඒ.පී. පියසේන [illegible] විසින් [illegible] 7 [illegible] [illegible] ප්‍රාදේශීය [illegible] අනුව ඒ.පී.පියසේන [illegible] ප්‍රාදේශීය [illegible] ඉඩම් කොටස් දීර්ඝකාලීන බද්දට ලබා දීම.

iii) කැබලි අංක 94 රජය සතු ඉඩමක් වශයෙන් නිරවුල් කර ඇත. එම ඉඩම් කොටස ඉහිරි ප්‍රදේශය වශයෙන් [illegible] කර ඇත. මෙම ප්‍රදේශයේ රජයේ ඉඩම්වල පදිංචි අනවසරකරුවන් හා [illegible] ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් අංක 2008/04 චක්‍රලේඛය අනුව කටයුතු කිරීම.

[illegible signature]
සහකාර ලේකම් (ඉඩම්)

ආ/භා: ආචාර්ය අයි.එච්.කේ. මහානාම
ලේකම්
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

පිටපත්: 1) [illegible] - කා.දැ.ස.
2). ඉඩම් කොමසාරිස් ජනරාල් - කා.දැ.ස.
3). හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් - කා.දැ.ස.

දුරකථන / தொலைபேசி / Telephone - 011-2888907
ෆැක්ස් / தொலைநகல் / Fax - 011-2887404
කාර්යාලය / அலுவலகம் / Office
දුරකථන / தொலைபேசி / Telephone - 011-2797500
ෆැක්ස් / தொலைநகல் / Fax - 011-2887445

"ඵලදායිතා ප්‍රවර්ධනය තුළින් විශිෂ්ටතම රාජ්‍ය සේවයක් කරා"
"உற்பத்தித் திறனூடாக அதிசிறந்த அரச சேவை"
"Towards an Excellent Public Service through Productivity Promotion"

FROM : FAX NO. : ඇමුණුම (07) 24 Oct. 2042 10:28AM P1

ඇමුණුම 03

(53)

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நில அளவைத் திணைக்களம்
SURVEY DEPARTMENT OF SRI LANKA
දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය - මාතලේ
மாவட்ட நில அளவை அலுவலகம் - மாத்தளை
DISTRICT SURVEY OFFICE - MATALE

දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය
මාතලේ

දුරකථන 066-2222567
ෆැක්ස් 066-2222567
විද්‍යුත් තැපෑල ssmatale@sltnet.lk

மாவட்ட நில அளவை அலுவலகம்
மாத்தளை
தொலைபேசி 066-2222567
தொலைநகல் 066-2222567
மின்னஞ்சல் ssmatale@sltnet.lk

District survey office
Matale.
Telephone 066-2222567
Fax 0662222567
E mail ssmatale@sltnet.lk

ඔබේ අංකය / உமது இல. / Your No 12/3/2/17/1-iv 30/2018

මගේ අංකය / எனது இல. / My No මා/මැ3/WLG/2019/35

දිනය / திகதி / Date 2019.03.[illegible]

25 MAR 2019

ප්‍රාදේශීය ලේකම්,
විල්ගමුව.

**<u>හෙට්ටිපොල නගරයේ ඉඩම් ගැටළු විසඳීම සඳහා මිනුම් නැවත විවෘත කිරීම සම්බන්ධවයි</u>**

**<u>Ma/WLG/2019/35</u>**

ඔබගේ ඉහත අංක හා 2018/12/31 දින දරන මැනුම් ඉල්ලීම අනුව රජයේ හා පුද්ගලික ඉඩම් වෙන්වන මායිම 2018.02.14 දින ක්ෂේත්‍රයේදී පහත නම් සඳහන් පාර්ශවයන් වෙත පෙන්වාදෙන ලද බව කාරුණිකව දන්වමි. මායිම් ඔබගත් ලිපි හා මිනින්දෝරු වරුන්ගේ වාර්තාව ද මේ සමඟ යවමි.

හෙට්ටිපොල වසමේ ග්‍රාම නිලධාරී

විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජනපද නිලධාරී

හෙට්ටිපොල වෙළඳ සංගමයේ සාමාජිකයින් කිහිපදෙනෙක්

ඊ.එම්.පී.බු. ඒකනායක
දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී
මාතලේ

ඊ.එම්.පී.බු. ඒකනායක
දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී
දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය
මාතලේ

3/25

ඇමුණුම 02

(13)

FROM : FAX NO. : 24 Oct. 2042 10:31AM P1

# ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
# இலங்கை நில அளவைத் திணைக்களம்
# SURVEY DEPARTMENT OF SRI LANKA


සර්වේයර් ජනරාල් කාර්යාලය

நில அளவையாளர் நாயகம் அலுவலகம்

SURVEYOR GENERAL'S OFFICE
P.O.Box 506, Colombo.
No.150, Bernard Soyza Mawatha (Kirula Road),
Narahenpita, Colombo 05.


මගේ අංකය -ASG(F)/10035/ E 01_2018/17
2018.10.22

පළාත් සර්වේයර් ජනරාල් ( මධ්‍යම පළාත ) මගින්
ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (මාතලේ)

**<u>හෙට්ටිපොල නගරයේ ඉඩම් ගැටළු සම්බන්ධයෙන් පැවැත්වූ විශේෂ සාකච්ඡාව</u>**

සර්වේයර් ජනරාල්ට පිටපත් සහිතව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද විල්ගමුව ප්‍රාදේශීය ලේකම්ගේ අංක 12/3/3/1/2-iv, 2018.10.04 දිනැති ලිපියේ පිටපතක් මේ සමග එවමි.

02. උක්ත ලිපියේ සඳහන් මැනුම් සඳහා මැනුම් ඉල්ලීමක් ලද පසු අදාල පාර්ශවයන් දැනුවත් කර මායිම් විවෘත කර පෙන්වීමට කටයුතු කරන්න.

S.D.P.J. DAMPEGAMA
Additional Surveyor General (Field)
Surveyor General's Office
Colombo - 05.

එස්. ඩී. පී.ජේ. දම්පෙගම
අතිරේක සර්වේයර් ජනරාල්(ක්ෂේත්‍ර)

පිටපත් : ලේකම් ( ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය) - කා. දැ. ස

✓ ප්‍රාදේශීය ලේකම් (විල්ගමුව) - කා. දැ. ස


Surveyor General — 2361569 (Tel), 2369363 (Fax), sg@survey.gov.lk
Additional Surveyor General — Field: 2361571 (Tel/Fax) addsgfield@survey.gov.lk; Land Titling & Land Information Systems: 2369037 (Tel / Fax) addsglt@survey.gov.lk; HR & Administration: 2368140 (Tel / Fax) addsghr@survey.gov.lk
Deputy Surveyor General — Resource Management: 2588992 (Tel / Fax); Document Management & Professional Standards: 2502872 (Tel / Fax); Research & Development: 2368601 (Tel / Fax); Mapping & Geo Names: 2369586 (Tel / Fax); Administration: 2587925 (Tel / Fax)
Director (Finance) — 2588045 (Tel / Fax) dirfn@survey.gov.lk
Senior Surveyor General — Land Titling: 2369026 (Tel / Fax); Land Information Systems: 2369855 (Tel / Fax); Geoinformatics: 2368102 (Tel / Fax); Information Technology: 2368101 (Tel / Fax); Geodetic: 2055971 (Tel / Fax)

**ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**
**உள்நாட்டலுவல்கள் அமைச்சு**
**MINISTRY OF HOME AFFAIRS**

මූල්‍ය අංශය
நிதிப் பிரிவு
Finance Division

31 OCT 2018

ගිණුම් අංශය

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திரச்சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

මගේ අංකය / எனது இல / My No: HA/F/16/MTL PAC/2017

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2018.10.18

25 OCT 2018

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මාතලේ

**රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී පරීක්ෂා කරන ලද මතභේදාත්මක කරුණු පිළිබඳ ප්‍රගතිය**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් නිකුත් කරන ලද 124 වන රැස්වීමේ කාර්ය සටහන් වාර්තාවේදී පහත කරුණ සම්බන්ධයෙන් විමසීම සිදු කරන ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත උපදෙස් ලබාදී ඇත. (අදාල සටහන් වාර්තාවේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.)

02. 2008 හා 2009 වර්ෂවල ගමනැගුම ව්‍යාපෘතිය යටතේ රු.1,177,331 ක් වැය කර ඉදිකර තිබූ විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ පිහිටි බත්ගම්පල සහල් සැකසීමේ මධ්‍යස්ථානය ආරම්භයේ සිටම ක්‍රියාත්මක කර නොතිබූ අතර එහි වූ යන්ත්‍ර සූත්‍ර හා ගොඩනැගිලි වෙනත් පාර්ශවයන් වෙත ලබාදීමට විගණන හා කළමනාකරණ කමිටුව තීරණය කර තිබුණි. විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2013 ජූනි 13 දින වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබූ අතර එම ගොඩනැගිලි හා යන්ත්‍ර සූත්‍ර වසර 5කට ආසන්න කාලයක් නිෂ්ක්‍රියව පැවතීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම නිෂ්කාර්ය වී තිබුණි. මේ සඳහා දරන ලද වියදම සිදු කිරීම සඳහා කටයුතු කළ ආකාරය පිළිබඳව රාජ්‍ය ගිණුම් කාරක සභාවේ අවධානය යොමු වූ අතර එහිදී බත්ගම්පල සහල් සැකසීමේ මධ්‍යස්ථානය ව්‍යාපෘති වාර්තාවක් නොමැතිව සිදු කරන ලද ඉදිකිරීමක් බවට තොරතුරු අනාවරණය වී ඇත. ඒ අනුව එය අපේක්ෂිත කාර්යයට යොදා නොගෙන වෙනත් කාර්යයක් සඳහා භාවිතා කිරීම හා ව්‍යාපෘති වාර්තාවක් නොමැතිව ඉදිකිරීම හේතුවෙන් සිදුවී ඇති අලාභය ගණනය කර එය අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීම තුලින් අනෙකුත් නිලධාරීන්ටද ආදර්ශයක් ලබාදිය හැකි බව වැඩිදුරටත් පෙන්වා දෙන ලදී.

03. මෙම ගැටළු සහගත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඔබ විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් සෘජුවම රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස දන්වා සිටින අතර එහි පිටපතක් අමාත්‍යාංශය වෙත ලබා දීමටද අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

එස්.ටී. කොඩිකාර
ලේකම්
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

පිටපත් :-

01. ලේකම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව
02. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
03. ප්‍රධාන ගණකාධිකාරී, මාතලේ දි.ලේ.කා.
04. ප්‍රධාන අභ්‍යන්තර විගණක, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක, මාතලේ දි.ලේ.කා.

දුරකථන / தொலைபேசி / Telephone: 0113135109 ෆැක්ස් / தொலைநகல்: 0112694291 විද්‍යුත් තැපෑල / மின்னஞ்சல்: homaf.finance@gmail.com වෙබ් අඩවිය: www.moha.gov.lk

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ**
**மாவட்ட செயலகம் - மாத்தளை**
**DISTRICT SECRETARIAT – MATALE**

කාර්යාලය / அலுவலகம் / Office - 066 2222233
දිසාපති / දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர் / GA/District Secretary - 066 2222285, 066 2222286
නිල නිවස / வீடு / Residency - 066 2222205
වෙබ් අඩවිය / இணைய தளம் / Web Site - www.matale.dist.gov.lk
විද්‍යුත් තැපැල / ஈ-மெயில் / e-mail - moha.dist.matale@gmail.com
ෆැක්ස් / பெக்ஸ் / Fax - 066 2226542


මගේ අංකය / எனது இல / My No - 1/2/13/1/5
ඔබේ අංකය / உமது இல. / Your No -
දිනය / திகதி - 2018. 11 / 01

ඩබ්.ඩබ්.පී.ඩබ්.එම්.ආර්. විජේසුන්දර මයා - සභාපති,
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්),
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ.

ඩබ්.එම්.එස්.කේ. දිසානායක මෙනවිය - සාමාජික,
ගණකාධිකාරී,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, විල්ගමුව.

**<u>බත්ගම්පල ප්‍රදේශයේ සහල් සැකසීමේ මධ්‍යස්ථානයේ වර්තමාන තත්ත්වය පිළිබඳ පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම</u>**

2008 සහ 2009 වර්ෂවල මහනැගුම ව්‍යාපෘතිය යටතේ විල්ගමුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි බත්ගම්පල ප්‍රදේශයේ සහල් සැකසීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කර ඇති අතර ආරම්භයේ සිටම මෙම ව්‍යාපෘතිය අසාර්ථක වී ඇත. ඊට අදාල ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර වසර 05කට අධික කාලයක් නිෂ්ක්‍රියව පැවති නිසා රජයට විශාල පාඩුවක් සිදුව ඇත.

02. මේ සම්බන්ධයෙන් මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් කරන ලද විමසීමේ දී මෙම අසාර්ථක ව්‍යාපෘතිය ආරම්භ කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව කටයුතු කරන ලෙසට ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නියෝග කර ඇත.

03. ඒ අනුව මෙම අසාර්ථක ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වැය කර ඇති මුදල කොපමණද යන්නත්, ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් කවුරුන් ද යන්නත්, ඊට අමතරව අදාළ ගොඩනැගිල්ල හා යන්ත්‍ර සූත්‍ර සම්බන්ධයෙන් වර්තමානයේ ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න පිළිබඳවත් පරීක්ෂණයක් සිදු කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලයේ සභාපති / සාමාජික ලෙස ඔබව පත් කරමි.

04. ඒ අනුව පරීක්ෂණ කටයුතු සිදු කර පරීක්ෂණ මණ්ඩල වාර්තාව සති 02ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි.

එස්. එම්. ජී. කේ. පෙරේරා,
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති,
මාතලේ.

ඇමුණුම (11)


# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ
# மாவட்ட செயலகம் - மாத்தளை
# DISTRICT SECRETARIAT – MATALE

කාර්යාලය/ அலுவலகம்/Office - 066 2222...

දිසාපති/දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர் / GA/District Secretary - 066 2222... / 066 2222...

නිල නිවස / வீடு / Residency - 066 2222...

ෆැක්ස් / பெக்ஸ் / Fax - 066 22265...

වෙබ් අඩවිය / இணைய தளம் / Web Site - www.matale.dist.gov.lk

විද්‍යුත් තැපැල / ஈ - மெயில் / e-mail - moha.dist.matale@gmail.com


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No - 1/2/13/1/5 | ඔබේ අංකය / உமது இல. / Your No - HA/F/16/MTL.PAC/2017 | දිනය / திகதி / Date - 2018.12. 11 |

ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
කොළඹ.

**<u>රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී පරීක්ෂා කරන ලද මතභේදාත්මක කරුණු පිළිබඳ ප්‍රගතිය</u>**

උක්ත කරුණට අදාල ඔබේ සමාංක හා 2018.10.18 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, එම ලිපියෙන් ඉල්ලා ඇති ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග හා වර්ථමාන ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් සපයන ලෙස දන්වා මාගේ සමාංක හා 2018.11.01 දිනැති ලිපියෙන් නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් පත්කර ඇත. (අදාල ලිපියේ පිටපතක් ඔබගේ කාරුණික දැන ගැනීම සඳහා මේ සමග අමුණා ඇත.)

03. එම මණ්ඩලයේ වාර්තාව ලද වහාම ඔබටද පිටපතක් සහිතව අදාල තොරතුරු ඇතුලත් වාර්තාවක් රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත යොමු කිරීමට කටයුතු කරනු ලබන බව මෙයින් කාරුණිකව දන්වා සිටිමි.

එස්.කේ. තිලකරත්න,
ප්‍රධාන ගණකාධිකාරී,
මාතලේ දිස්ත්‍රික් ලේකම් වෙනුවට.


අතිරේක දිස්ත්‍රික් ලේකම් / மேலதிக மா.செயலாளர் / Add.Dis.Secretary / 066 2222413

සහකාර දිස්ත්‍රික් ලේකම් / உதவி மா.செயலாளர் / Asst. Dis.Secretary / 066 2222215

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant / 066 2222785

පරිපාලන නිලධාරී / நிருவாக அலுவலர் / Admin Officer / 066 2222700

අධ්‍යක්ෂ(සැලසුම්) / பணிப்பாளர் திட்டமிடல் / Director (Planning) / 066 2222143

Asst.Com.-Samurdhi / 066 2222051

ඇමුණුම (12)


දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ
மாவட்ட செயலகம் - மாத்தளை
DISTRICT SECRETARIAT – MATALE

කාර්යාලය/அலுவலகம்/Office - 066 2222233
දිසාපති/දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர் / GA/District Secretary 066 2222235, 066 2222236
නිල නිවස / வீடு / Residency 066 2222205
ෆැක්ස් / பெக்ஸ் / Fax 066 2226542
වෙබ් අඩවිය / இணைய தளம் / Web Site www.matale.dist.gov.lk
විද්‍යුත් තැපෑල / ஈ - மெயில் / e-mail moha.dist.matale@gmail.com


මගේ අංකය / எனது / My No 1/2/8/1/2
ඔබේ අංකය / உமது இல. / Your No
දිනය / திகதி / Date 2018.06.22

අයවැය අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අයවැය දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.

## අත්තිකාරම් බී ගිණුම් සීමා සංශෝධනය - 2014

2014 වර්ෂයේ අවම ලැබීම් සීමාව රුපියල් 27,000,000.00 සිට රුපියල් 25,000,000.00 දක්වා අඩු කර ගැනීම සඳහා මගේ සමාංක හා 2014.12.31 දිනැති ලිපිය මඟින් ස්වදේශ කටයුතු අමාත්‍යංශය වෙත සීමාසංශෝධන සංදේශය ඉදිරිපත් කර ඇත. (එහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.)

02. ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යංශ ලේකම්ගේ අංක HFA/F/14/ADVPR/027 හා 2015.03.17 දිනැති ලිපිය, මටද පිටපතක් සහිතව ඔබ වෙත ඉදිරිපත් කර ඇත. ( එම ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත. ) නමුත් මේ දක්වා එම සීමා සංශෝධනය සඳහා අනුමැතිය ලැබී නොමැති අතර ඒ පිළිබඳව විගණන කලමණාකරණ කමිටු රැස්වීම් වලදී ද නිතර විමසුමට ලක්වේ.

03. එබැවින් එම සීමා සංශෝධනය සඳහා අනුමැතිය ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.කේ.තිලකරත්න
ප්‍රධාන ගණකාධිකාරී
මාතලේ දිස්ත්‍රික් ලේකම් වෙනුවට

එස්.කේ. තිලකරත්න
ප්‍රධාන ගණකාධිකාරී
මාතලේ දිස්ත්‍රික් ලේකම් වෙනුවට

O/C

පිටපත් -
1 විගණකාධිපති - දැ.ගැ.ස
2 රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් - දැ.ගැ.ස
3 ස්වදේශ කටයුතු අමාත්‍යංශය - දැ.ගැ.ස


අතිරේක දිස්ත්‍රික් ලේකම් / மேலதிக மா.செயலாளர் / Add.Dis Secretary 066 2222413
සහකාර දිස්ත්‍රික් ලේකම් / உதவி மா.செயலாளர் / Asst Dis Secretary 066 2222215
ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant 066 2222785
පරිපාලන නිලධාරී / நிருவாக அலுவலர் / Admin Officer 066 2222700
අධ්‍යක්ෂ (සැලසුම්) / பணிப்பாளர் திட்டமிடல் / Director (Planning) 066 2222143
ස.කොමසාරිස් -සමෘද්ධි / உ-அனையாளர்-சமுர்த்தி / Asst Com -Samurdhi 066 2222051

ඇලවුම (15)

දුරකථන/தொலைபேசி/Telephone
කාර්යාලය/அலுவலகம் /Office 066 2222233

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ
# மாவட்ட செயலகம் - மாத்தளை
# DISTRICT SECRETARIAT – MATALE

| | |
|---|---|
| දිසාපති/දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர் / GA/District Secretary | 066 2222235<br>066 2222236 |
| නිල නිවස / வீடு / Residency | 066 2222205 |
| ෆැක්ස් / பெக்ஸ் | 066 2226542 |

වෙබ් අඩවිය / இணையத் தளம் / Web Site: www.matale.dist.gov.lk
විද්‍යුත් තැපෑල / ஈ - மெயில் / e-mail: gamatale@sltnet.lk

මගේ අංකය / எனது இல / My No: දිලේ/5/11/මිල කමිටු 2017
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2017.07.11

ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
විහාර පාර,
මාතලේ.

**<u>මිල ගණන් නියම කිරීම - මාතලේ දිස්ත්‍රික්කය</u>**

2017.07.11 දින පැවති දිස්ත්‍රික් විගණන කමිටුවේදී ගනු ලැබූ තීරණ අනුව මගේ කාර්යාලයේ අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) විසින් ඔබ වෙත දෙනු ලැබූ දුරකථන ඇමතුමට වැඩිමනත් වශයෙනි.

02. ඒ අනුව 2017 වර්ෂයේ මුල් භාගය සඳහා 2017.02.27 දින පැවති දිස්ත්‍රික් මිල ගණන් නියම කිරීමේ කමිටුව මගින් ගනු ලැබූ තීරණ කිහිපයක් සංශෝධනය විය යුතු බැවින්, 2017 අග භාගය සඳහා වූ මිල කමිටු රැස්වීමේදී මිල ගණන් නියම වන තෙක් 2017 මුල් භාගයේ මිල ගණන් අනුව ඇස්තමේන්තු සකස් කිරීම තාවකාලිකව නතර කරන මෙන් කාරුණිකව දන්වමි.

ඩී.පී.ජී. කුමාරසිරි
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
මාතලේ.

o/c

| අතිරේක දිස්ත්‍රික් ලේකම් / மே. மா.செயலாளர் / Add.Dis.Secretary / 066-2222413 | සහකාර දිස්ත්‍රික් ලේකම් / உதவி மா.செயலாளர் / Asst.Dis.Secretary / 066-2222215 | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant / 066-2222785 | පරිපාලන නිලධාරී / நிருவாக அலுவலர் / Admin Officer / 066-2222700 | අධ්‍යක්ෂ (සැලසුම්) / பணிப்பாளர் திட்டமிடல் / Director (Planning) / 066-2222143 | ස.කොමසාරිස් සමෘද්ධි / உதவி ஆணையாளர்-சமுர்த்தி / Asst.Com - Samurdhi / 066-2222051 |
|---|---|---|---|---|---|

ජාතික තරුණ සේවා සභාව
தேசிய இளைஞர் சேவைகள் மன்றம்
